**ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2019**

---

ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ, පහසුකම් ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස්ආර්අයි (එස්එෆ්) දරණ ණය ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය.

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශක්‍යතා අධ්‍යයනය, විස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භක අදියර තුළදී ක්‍රියාත්මක කිරීමේ සහාය ලබා දීම මඟින් මාර්ග, දුම්රිය හා වරාය යන උප අංශවල ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල ආරම්භක කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු. මිලියන 1697.48 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 11.34 ක් වන අතර ඉන් රු. මිලියන 1496.90 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු. මිලියන 200.58 ශ්‍රී ලංකා රජයේ අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 28 දින ආරාම්භ කරන ලද අතර, 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වා ගණනය කළ මතය.

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. ව්‍යාපෘතිය මඟින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | ගිණුම්කරණ අඩුපාඩු. | වටිනාකම (රු.මිලියන) | බලපෑම. | කළමනාකරණයේ අදහස් දැක්වීම. | විගණකගේ නිර්දේශ. |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මහ බැංකු අග්‍රිම ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන රු.මිලියන 2.38 ක් වූ විනිමය ලාභය වැරදි ලෙස ගිණුම්කරණය කිරීම හේතුවෙන් එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 1.39 ක අලාභයක් ලෙස දක්වා තිබුණි. | 3.77 | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන අග්‍රිම අරමුදල් ප්‍රත්‍යාගණන ගිණුම සහ මුළු ජංගම වත්කම් ඌන තක්සේරු වී ඇත. | එකඟ විය. වැරදීමක් නිසා එය සිදු වී ඇත. | ව්‍යාපෘතියේ සැබෑ තත්ත්වය පිළිඹිබු වන පරිදි විනිමය ලාභය සහ අලාභය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව සමාලෝචිත වර්ෂයේ ණය සඳහා පොළිය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 50.41 | කෙරිගෙන යන වැඩ ඌණ තක්සේරු වී ඇත. | 2019 වර්ෂයේ ගෙවීම් නොමැති නිසා ව්‍යාපෘති පොළිය ගිණුම් ගතකර නොමැත. | ණය ලබාගෙන තිබුණත් නොතිබුණද පොළිය ගිවිසුම් ප්‍රකාරව වැයක් ලෙස ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී ජ'නල් වවුචර් 12 ක් පිළියෙල කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 180 | අභ්‍යන්තර පාලනයේ දූර්වලතා | වර්තමානයේ දී ජ'නල් වවුචර් ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් අනුමත කර ඇත. | සියලුම ජ'නල් වවුචර් ලෙජරයට පිටපත් කිරීමට පෙර අනුමත කළ යුතුය. |
| (ඈ) | එකම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තුළ විදේශ ආධාර ව්‍යාපෘති හතරක් ක්‍රියාත්මකව පැවතියද ඊට අදාළ සම්පූර්ණ ගොඩනැගිලි කුලිය මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන යේ දක්වා තිබුණු අතර, එය අනෙකුත් ව්‍යාපෘති අතර බෙදා වෙන්කර නොතිබුණි. | 6.2 | ව්‍යාපෘතියේ ගොඩනැගිලි කුලී වටිනාකම අධිතක්සේරු වී තිබුණි. | එකඟ විය. කෙසේ නමුත් මේ සම්බන්ධව විවිධ දූෂ්කරතාවන්ට මුහුණ දී තිබේ. | පිළිගත හැකි වෙන්කිරීම් පදනම මත සියලුම පොදුකාර්ය එක් එක් ව්‍යාපෘති වලට වෙන් වෙන්ව ගිණුම්ගත කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය.

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.

ව්‍යාපෘති මඟින් නිම කිරීමට හඳුනාගෙන ඇති වැඩ අයිතම හයෙන්, උපදේශනය (තනි පුද්ගල) - අන්තර් ජාතික රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාර ප්‍රසම්පාදන උපදේශක, උපදේශනය (තනි පුද්ගල) - ප්‍රවාහන ආකෘති සැකසීම (03 ක්), අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යන අයිතම තුන 2019 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කර නොතිබුණි.

### 3.2 ඌණ උපයෝජිත වත්කම්.

| විගණන නිරීක්ෂණය | බලපෑම. | කළමනාකරණයේ අදහස් දැක්වීම. | විගණකගේ නිර්දේශ. |
| --- | --- | --- | --- |
| රුපියල් මිලියන 18.5 ක අයවැය ප්‍රතිපාදන වලින් 2019 දෙසැම්බර් 31 දින වන විට භාවිතා කර ඇත්තේ රු.මිලියන 3.75 ක් පමණි. | ව්‍යාපාතියේ අරමුණු සක්ෂාත් කර ගත නොහැකි වී ඇත. | එකඟ විය | මූල්‍ය සම්පත් ඵලදායීව හා ප්‍රමුඛව උපයෝගී කර ගැනීමට පියවර ගත යුතුය. |